## උපත්

### පිටරටක උපත වාර්තා කිරීම

එක්සත් ජනපද පුරවැසි දෙමාපියන් ලෙස පිටරටක දී දරුවෙක් ඉපදුණු විට හැකි තරම් ඉක්මනින් ඒ බව එක්සත් ජනපද තානාපති කාර්යාලයට වාර්තා කළ යුතු ය. මෙම නිල වාර්තාව මඟින් දරුවාට උපතේ දී එක්සත් ජනපද පුරවැසිභාවය හිමි වේ. මෙම නිල වාර්තාව වන්නේ එනම් FS-240 පෝරමය වන පිටරට උපතක් පිළිබඳ කොන්සියුලර් වාර්තාවයි. මෙම පෝරමය එක්සත් ජනපදයේ මූලික පුරවැසි ලේඛනය වේ.

### පිටරටක උපත පිළිබඳ කොන්සියුලර් වාර්තාව (CRBA)

සංක්‍රමණ හා ජාතිකත්ව පනත (INA) යටතේ පුරවැසිභාවය ලැබීමේ අවශ්‍යතා සපුරා ලන එක්සත් ජනපද පුරවැසි දෙමාපියන්ට පිටරටක දී උපන් දරුවෙක් සම්බන්ධයෙන් නිකුත් කරන පිටරට උපත පිළිබඳ කොන්සියුලර් වාර්තාව (CRBA) එක්සත් ජනපද පුරවැසිභාවය පිළිබඳ සාක්ෂියකි.

පිටරට උපතක් පිළිබඳ කොන්සියුලර් වාර්තාව (CRBA) සඳහා ඉල්ලීම ළමයාගේ 18වැනි උපන් දිනයට පෙර කළ යුතුය. ළමයාගේ උපතින් පසුව හැකි තාක් ඉක්මනින් මෙම වාර්තාව සඳහා ඉල්ලුම් කරන ලෙස දෙමාපියන්ට අපි නිර්දේශ කරමු. කිසි දිනක පිටරට උපත පිළිබඳ කොන්සියුලර් වාර්තාවක් (CRBA) නිකුත් නො කළ වයස 18ට වැඩි අයදුම්කරුවන් කරුණාකර එක්සත් ජනපද පුරවැසිභාවය ඉල්ලීම සඳහා ඇති ද්විතීයික ක්‍රම බලන්න. වෙන රටක පුරවැසිභාවය තිබුනත් එක්සත් ජනපද පුරවැසිභාවය ඇති ඕනෑම කෙනෙකුට එක්සත් ජනපදයට ඇතුල් වීම හා පිටවීම සඳහා වලංගු එක්සත් ජනපද ගමන් බලපත්‍රයක් තිබිය යුතු ය.

පිටරටක උපත පිළිබඳ කොන්සියුලර් වාර්තාවක් (CRBA) නිකුත් කිරීම

එක්සත් ජනපදයෙන් පිටත උපන් ළමයෙකුට එක්සත් ජනපද පුරවැසිභාවය තහවුරු කරන මූලික ලේඛනය වන්නේ මෙයයි. පහත දැක්වෙන තත්වයන් හා කොන්දේසි යටතේ එක්සත් ජනපද පුරවැසි දෙමාපියෙකුට පිටරටක දී උපන් දරුවාට පුරවැසිභාවය ලබා දීමට හැකි වේ.

**විවාහක එක්සත් ජනපද පුරවැසි දෙමාපියන් දෙදෙනෙකුට පිටරටක දී උපන් දරුවා:** එක්සත් ජනපද පුරවැසි දෙමාපියන් දෙදෙනෙකුට පිටරටක දී උපන් දරුවෙකුට සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 301(c) වගන්තිය යටතේ උපතේ දී එක්සත් ජනපද පුරවැසිභාවය හිමි වේ. දරුවාගේ උපතට පෙර එක් දෙමාපියෙක් එක්සත් ජනපදයේ නේවාසික ව ජීවත් වී තිබිය යුතුය. ඒ සඳහා නියමිත කාලයක් දක්වා නැත.

**විවාහක එක්සත් ජනපද පුරවැසි එක් දෙමාපියෙකුට හා එක් විදේශීය දෙමාපියෙකුට පිටරටක දී උපන් දරුවා:** ළමයා උපදින අවස්ථාවේ අදාළ නීතියෙන් දක්වා ඇති කාලය, සපුරාලන ලෙස එක්සත් ජනපද පුරවැසි දෙමාපියා, එක්සත් ජනපදයේ ශාරීරිකව සිටියේ නම් එක් එක්සත් ජනපද පුරවැසි දෙමාපියෙකුට හා එක් විදේශීය දෙමාපියෙකුට පිටරටක දී උපන් දරුවාට සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 301(g) වගන්තිය යටතේ උපතේ දී එක්සත් ජනපද පුරවැසිභාවය හිමි වේ. 1986 නොවැම්බර් 14 වැනිදා හෝ ඊට පසු උපතක් සම්බන්ධයෙන් අවුරුදු පහක කාලයක් ශාරීරිකව රටේ සිටීමත් එයින් දෙකක් වයස අවුරුදු 14න් පසුව වීමත් අවශ්‍ය වේ. 1952 දෙසැම්බර් 24 හා 1986 නොවැම්බර් 13 දක්වා කාලයේ සිදුවූ උපතක් සම්බන්ධයෙන් දරුවාට එක්සත් ජනපද පුරවැසිභාවය ලැබීමට දෙමාපියා එක්සත් ජනපදයේ ශාරීරිකව අවුරුදු දහයක කාලයක් සිටීම හා එයින් පහක් වයස අවුරුදු 14න් පසුව වීම අවශ්‍ය වේ.

**එක්සත් ජනපද පුරවැසි පියෙකුට පිටරටක දී විවාහයෙන් පිට උපන් දරුවා:** පහත දැක්වෙන කරුණු සම්පූර්ණ කර ඇත්නම් සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 309(a) වගන්තියෙන් යෙදෙන ආකාරයට (INA) 301(g) වගන්තිය යටතේ එක්සත් ජනපද පුරවැසිභාවය ලබා ගත හැකි වේ.

1. පැහැදිලි හා පිළිගත හැකි සාක්ෂිවලින් අයදුම්කරු හා පියා අතර ලේ නෑකමක් ඇති බව තහවුරු කිරීම.
2. අයදුම්කරු උපදින අවස්ථාවේ පියා එක්සත් ජනපද පුරවැසියෙක් වීම
3. අයදුම්කරුට වයස 18 වන තෙක් මූල්‍ය ආධාර සැපයීමට (මිය ගොස් නැත්නම්) පියා ලිඛිත ව එකඟ වීම.
4. පුද්ගලයාගේ වයස අවුරුදු 18 අඩු කාලයේ
    - අයදුම්කරු නේවාසික ව හෝ නිත්‍ය පදිංචිය ඇති රටේ නීතිය අනුව සුජාතකත්වය තිබීම.
    - දිවුරුමක් යටතේ පියා විසින් ලිඛිත ව පිතෘත්වය පිළිගැනීම හෝ
    - අයදුම්කරුගේ පිතෘත්වය උසාවියක් මගින් තීන්දු කිරීම

**එක්සත් ජනපද පුරවැසි මවකට පිටරටක දී විවාහයෙන් පිට උපන් දරුවා:** දරුවා උපදින අවස්ථාවේ මව එක්සත් ජනපද පුරවැසියෙක්ව සිටියේ නම් හා ඊට කලින් අඛණ්ඩව වර්ෂයක කාලයක් මව එක්සත් ජනපදයේ හෝ එයට අයත් භූමි ප්‍රදේශයක ශාරීරිකව සිටියේ නම් සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 309(c) වගන්තියෙන් යෙදෙන ආකාරයට (INA) 301(g) වගන්තිය යටතේ දරුවාට එක්සත් ජනපද පුරවැසිභාවය ලබා ගත හැකිවේ.

විධිමත් අයැදුම් කිරීමක් සඳහා පිටරට උපතක් පිළිබඳ කොන්සියුලර් වාර්තාව සඳහා අයදුම්පතක්, මුදලින් ගාස්තු ගෙවීම හා පහත දැක්වෙන ලියවිලි අවශ්‍ය වේ.

1. ළමයාගේ මුල් උප්පැන්න සහතිකය හා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකුගෙන් ලබා ගත් ඉංග්‍රීසි පරිවර්තනයක්
2. දෙමාපියන්ගේ විවාහ සහතිකය හා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකුගෙන් ලබා ගත් ඉංග්‍රීසි පරිවර්තනයක්
3. කලින් විවාහ වී සිටියේ නම් එම විවාහ අවලංගු කළ බවට සාක්ෂි.
4. දෙමාපියන්ගේ ගමන් බලපත්‍ර
5. රෝහල් චිකිත්සක කාඩ්පත, ප්‍රසූති වාර්තාව, ගර්භණී වාර්තා, ළමා රෝග විශේෂඥ වාර්තා හා වෙනත් රෝහල් වාර්තා
6. එක් දෙමාපියෙක් පමණක් එක්සත් ජනපද පුරවැසියෙක් නම්- එම දෙමාපියා ශාරීරික වශයෙන් එක්සත් ජනපදයේ අවුරුදු පහක් සිටි බවට හා එයින් දෙකක් වයස අවුරුදු14න් පසුව බව පෙන්වීමට ඇති වාර්තා. මෙම සාක්ෂිවලට ගමන් බලපත්‍රයේ ඇතුළුවීමේ හා පිටවීමේ මුද්‍රා හා අධ්‍යාපන වාර්තා ඇතුළත් විය හැකි නමුත් ඒවාට සීමා විය යුතු නැත.
7. දෙමාපියන් දෙදෙනා ම එක්සත් ජනපද පුරවැසියන් නම් අඩු වශයෙන් එක් දෙමාපියෙක් ළමයාගේ උපතට පෙර කවදා හෝ ඔහු හෝ ඇය එක්සත් ජනපදයේ නේවාසික ව සිටි බව ඔප්පු කිරීමට සාක්ෂි. මෙම සාක්ෂිවලට මාස හයකට වැඩි කාලයක වැටුප් පත්‍රිකා, උපයෝගිතා හා බදු ගෙවීම් ආදිය ඇතුළත් විය හැකි අතර ඒවාට සීමා විය යුතු නොවේ.

මේ අවස්ථාවේ ම ළමයාගේ එක්සත් ජනපද ගමන් බලපත්‍රය හා සමාජ සුරක්ෂිතතා අංකය ඉල්ලුම් කරන ලෙස දෙමාපියන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය තරම් කාලයක් දෙමාපියන් ශාරීරික වශයෙන් එක්සත් ජනපදයේ නො සිටීම හෝ ළමයා උපන්නේ දෙමාපියන් එක්සත් ජනපද පුරවැසිභාවය ලබාගැනීම පෙර හෝ වීම නිසා ළමයා එක්සත් ජනපද පුරවැසිභාවයට සුදුසුකම් නො ලැබුවත් ඔහුට/ඇයට වර්ෂ 2000 ළමා පුරවැසි පනත හෝ පවුල් පදනම් සංක්‍රමණය (Child Citizenship Act of 2000 or Family Based Immigration) යටතේ එක්සත් ජනපද පුරවැසිභාවය ලබාගැනීමට සුදුසුකම් තිබිය හැකියි.

කරුණාකර ඉල්ලුම් කිරීමට දිනයක් හා වේලාවක් ලබා ගන්න.

https://evisaforms.state.gov/acs/default.asp?postcode=CLM&appcode=1

**එක්සත් ජනපද පුරවැසිභාවය පැවරීම**

එක්සත් ජනපද පුරවැසිභාවය පැවරීම පහත සඳහන් කරුණු මත රැඳී පවතී.

1. ළමයා උපදින අවස්ථාවේ අඩු ම වශයෙන් එක් දෙමාපියෙකුට එක්සත් ජනපද පුරවැසිභාවය තිබීම.
2. ළමයා හා එක්සත් ජනපද පුරවැසි දෙමාපියන් සමග ලේ නෑකමක් තිබීම.
3. අවශ්‍ය ආකාරයට ළමයාගේ උපතට පෙර එක්සත් ජනපද පුරවැසි දෙමාපියන් එක්සත් ජනපදයේ ජීවත් වූ බව ඔප්පු කළ හැකි ලිඛිත සාක්ෂි.

**ලේඛන පිළිබඳ උදාහරණ**

ශාරීරික වශයෙන් රටේ සිටි බව ඔප්පු කිරීමට ඉදිරිපත් කළ හැකි ලේඛන සඳහා උදාහරණ පහත දැක්වේ (නමුත් ඒවාට සීමා විය යුතු නැත)

- වැටුප් හා බදු ප්‍රකාශන (W-2)
- අධ්‍යාපන සහතික
- රැකියා වාර්තා
- කුලී ලදුපත්
- එක්සත් ජනපද හමුදාවේ ගරු සේවය, එක්සත් ජනපද රජයේ හෝ අන්තර් රාජ්‍ය හෝ අන්තර් ජාතික සංවිධානයක රැකියාව, එවැනි රැකියාවක යෙදුණු දෙමාපියෙකුගේ නිවසේ සාමාජිකයෙක් හෝ අවිවාහක ළමයෙක් (වෙනස් ලෙස දක්වා ඇති අවස්ථාවල දී හැර) ලෙස සිටි බවට වාර්තා.
- එක්සත් ජනපද ගමන් බලපත්‍ර මුද්‍රා, සාක්ෂිවල කොටසක් ලෙස සැලකිය හැකි නමුත් එය එක ම ලිඛිත සාක්ෂිය නො විය යුතු ය. රියදුරු බලපත්‍ර ශාරීරික වශයෙන් සිටි බවට සාක්ෂියක් නොවේ.

  පිටරට උපත පිළිබඳ කොන්සියුලර් වාර්තාව නිකුත් කළ වෙනත් දරුවන් ඔබට සිටී නම් එය අතිරේක සාක්ෂියක් ලෙස සැලකිය හැකියි. කරුණාකර ආධාරක ලේඛන පිළිබඳ වැදගත් තොරතුරු කියවන්න.